# බෞද්ධ පූජා චාරිත්‍ර කටයුතු හා පාලිභාෂා ඥානයේ අවශ්‍යතාව

**බළන්ගොඩ මෙත්තානන්ද හිමි**

බෞද්ධයා තිසරණ සහිත පන්සිල් සමාදන් වනුයේ පාලිභාෂාමය වාක්‍ය ප්‍රකාශ කිරීමෙනි. බුද්ධ වන්දනා, පිරිත් සජ්ඣායනා, විවිධ පූජා ප්‍රාර්ථනාදිය තබනුයේ ද පාලි භාෂාමය ගාථා හා පාඨ උපයෝගී කර ගනිමනි. ශ්‍රැති මාත්‍රයෙන් හෝ කියවා කට පාඩම් කරගැනීමෙන් හෝ ගාථා හා පාඨ වහරන බොහෝ බෞද්ධයෝ එහි අරුත් නොදනිති. අනවබෝධයෙන් සදොස් ව උසුරුවති.

බොහෝ ආගම්වල පුද පූජා හා වන්දනා හා සම්බන්ධ පාඨ නිවැරදි ව උච්චාරණය කිරීම අත්‍යවශ්‍ය කරුණක් ලෙස සලකනු ලැබේ. ආගමික පාඨ, මන්ත්‍ර හෝ වාක්‍ය වරදවා උච්චාරණය කිරීමෙන් නියම ප්‍රතිඵල ලද නොහැකි බව ඇතැම් ඇදහිලිවල ඉගැන්වේ. එසේ ම ඇතැම් ආගම්වල ඉගැන්වීම්වලට ආගමික පාඨ අල්ප මාත්‍රයකුදු වරදවා උච්චාරණය කළහොත් නැවත මුල සිට කියවිය යුතු ය. බුදු දහමෙහි ද නිවැරදි උච්චාරණය ඉතා වැදගත් කරුණක් ලෙස සැලකේ. විශේෂයෙන් භාණක පරම්පරා මගින් සියවස් ගණනාවක් ම මුඛ පරම්පරානුගත ව ධර්මය රැගෙන ඒමේදී පිරිසිදු ධර්මය විකෘති නොවීම උදෙසා නිවැරදි උච්චාරණය පිළිබඳ සැලකිලිමත් වීම අතිශය වැදගත් වූවකි.

පූජා චාරිත්‍ර කටයුතුවලදී ද අර්ථාවබෝධය හා නිවැරදි උච්චාරණය වැදගත් වේ. වන්දනා පාඨාදිය සජ්ඣායනය කළ ද අර්ථය නොවැටහේ නම් ඉන් ඥාන සම්ප්‍රයුක්ත කුසලයක් අත් නොවේ. පූජා චාරිත්‍ර කටයුතුවලදී භාවිත කරන පාලි ගාථා හා වන්දනා පාඨ පුළුල් පරාසයක විහිද යන්නකි. මෙම ලිපියෙන් බලාපොරොත්තු වන්නේ අද බහුලව සදොස් ව ව්‍යවහාර කරන පාලි ගාථා හා පාඨ කිහිපයක් පමණක් විමසමින් අර්ථවත් ව වන්දනා හෝ පූජා කටයුතු සිදුකළ හැකි අයුරු විමසා බැලීමටයි. සදොස් ව්‍යවහාරයන්ට හේතු කිහිපයක් පහත පරිදි පෙන්විය හැකිය.

- **පාලි භාෂාව පිළිබඳ අනවබෝධය**
- **සාවද්‍ය ව සම්පාදිත ගාථා පොත් භාවිතය**
- **ශ්‍රැති මාත්‍රයෙන් ධාරණය කරගෙන තිබීම**
- **හැඩයෙන් සමාන සිංහල අකුරු පටවාගැනීම**

ලක්වැසි සමස්ත ගිහි ප්‍රජාව පාලි පිළිබඳ උගත්තෝ නොවෙති. එයට හේතුව පාලිය ගිහියාට සම්ප්‍රේෂණය වීමේ මාධ්‍ය අඩුබවයි. පාලි ගාථාදිය සදොස් ව ව්‍යවහාර වීමට ප්‍රධාන හේතුව භාෂාව පිළිබඳ ඇති මෙම නොදැනුමයි. පාලි භාෂාව පිළිබඳ නොදැනීම නිසා සිංහලයෙන් පන්සිල් සමාදන් වීම, පිරිත් කීම වැනි දෑ අද අසන්නට ලැබේ. එය පිළියමක් නොවේ. සියවස් ගණනාවක් නේක විධ දුෂ්කරතා මධ්‍යයේ බුදුදදහම සුරක්ෂිත කර දුන් පාලිභාෂාව හැර අද මෙතරම් පහසුකම් මධ්‍යයේ සිංහලයෙන් පමණක් භාවිතා කිරීම පාලි භාෂාවට කරන විශාල ම අනර්ථකාරී ක්‍රියාව යි. තව ද එසේ යමෙකු කරන්නේ නම් ඒ ඔහුගේ පිරිසිදු ථෙරවාද බුදුදහමේ මාධ්‍යය පිළිබඳ නූගත්කම ප්‍රදර්ශනය කිරීමකි. සාමාන්‍ය ගිහි බෞද්ධයාට පාලිභාෂාව පිළිබඳ පෘථුල අවබෝධයක් අවශ්‍ය නොවේ. නමුත් අවම වශයෙන් එදිනෙදා පූජාචාරිත්‍රවලදී යොදා ගන්නා ගාථාදිය පිළිබඳ ව අවබෝධයක් තිබීම අත්‍යවශ්‍ය ය. අද ගිහියන් පමණක් නොව ඇතැම් භික්ෂූන් වහන්සේලා ද ගාථාදිය සදොස් ව වැහැරීම කණගාටුවට කරුණකි.

තිසරණ පාඨත්‍රය අවසන සමහර භික්ෂූන් වහන්සේලා **'සරණාගමනං සම්පුණ්ණං'** හෝ **'තිසරණගමනං සම්පුණ්ණං'** යනුවෙන් පාලි ප්‍රකාශයක් සිදු කරයි. එහි දී අනුගාමික ගිහි බෞද්ධයා **'ආම භන්තේ'** (එසේය ස්වාමීනී) යැයි ප්‍රකාශ කිරීම චාරිත්‍රය යි. එහිදී ඇතැමෙකු **'අහං භන්තේ '** යැයි ප්‍රකාශ කෙරෙනු ඇසේ. එය සාවද්‍ය ය. **'සරණාගමනං සම්පුණ්ණං'** හෝ **'තිසරණගමනං සම්පුණ්ණං'** යනුවෙන් භික්ෂූන් වහන්සේ අසනුයේ 'තෙරුවන් සරණ යෑම සම්පූර්ණ ද?' යන්නයි.

පහන් පූජා කිරීම සඳහා බහුල ව භාවිතා කරනුයේ **"ඝනසාරප්පදිත්තේන"** යන ගාථාවයි. ඝනසාර කපුරු ය. මේ ගාථාව වඩාත් සුදුසු වනුයේ කපුරු යොදා පහන් දැල්වීමේ දී ය. එසේ නොමැති අවස්ථාවන්වල **"සද්ධාය සම්පදිත්තේන"** යනු ගාථාව භාවිත කිරීම වඩාත් යෝග්‍ය ය. භාෂාවබෝධය නොමැති බැවින් වන්දනා කටයුතුවලදී මෙවැනි අවස්ථා බොහෝමයක් දැක ගත හැකිය. පාලි භාෂාවේ අකුරු හල් නොකිරීමත් හල් බව සංකේතවත් කිරීමට බැඳි අකුරු යෙදීමත් ඇතැම් තැනක සංදිග්ධතාවන් මතු කර ඇත. තව ද වැරදි ලෙස වචන බෙදමින් ගාථා භාවිත කරනු ද පෙනේ. පහත දක්වා ඇත්තේ එවැනි අවස්ථා කිහිපයකි.

| **නිවැරදි භාවිතය** | **වැරදි භාවිතය** |
|---|---|
| කාමෙසු මිච්ඡාචාරා | කාමෙ සුමිච්ඡාචාරා |
| අධිවාසේතු නො භන්තේ | අධිවාසේ තුනො භන්තේ |
| සබ්බයානෙසු පතිට්ඨිතං | සබ්බයානෙ සුපතිට්ඨිතං |
| මා මෙ බාලසමාගමො | මාමෙ බාලසමාගමො |
| සබ්බීතියො විවජ්ජන්තු | සබ්බීතියෝවි වජ්ජන්තු |

මේ ආකාරයට සාවද්‍ය ලෙස ගැයෙන අවස්ථා පමණක් නොව මුද්‍රණය කළ තැන් ද හමුවේ. කිසිදු ප්‍රමිතියකින් තොර ව මූල්‍යමය අරමුණු වෙනුවෙන් පමණක් කෙරෙන ගාථා පොත් මුද්‍රණය කිරීම් වැනි කටයුතු සාවද්‍ය ව්‍යවහාරයන් සමාජගත වීමට එක් ආකාරයකින් හේතු වී ඇත. නිසි දැනුමකින් තොර ව හා සෝදුපත් බැලීමකින් තොර ව එලෙස ග්‍රන්ථ මුද්‍රණය කර සමාජගත කිරීම බරපතළ ලෙස මෙම ව්‍යසනයට හේතු වී ඇත. විශේෂයෙන් දහම්පාසල් පොත්වල පවා පාලි ගාථා හා සූත්‍ර බහුල ලෙස සාවද්‍ය ව මුද්‍රණය කර තිබීම අන් පොත්පත් පිළිබඳ විස්තර කිරීම එලරහිත කොට ඇත. මෙලෙස සාවද්‍ය භාවිතයන් ඇති වීමට ප්‍රධාන හේතුව වී ඇත්තේ සිංහල භාෂාවේ සමාන හැඩයකින් යුතු අකුරු පටලවා ගැනීමයි. 'ව-ච' 'භ-හ' 'ස-ස' වැනි අකුරු නිතර එලෙස වැරදි ලෙස වහරති. අල්පප්‍රාණ හා මහාප්‍රාණ අක්ෂර පිළිබඳ අනවබෝධය ද ඇතැම් තැනක සාවද්‍ය ව්‍යවහාරයන් ඇති කොට ඇත. "මජ්ජපමාදඡ්ඨානා", "සංදිඡ්ඨිකො", යනාදී වශයෙන් ඇතැම් කුඩා දරුවන් කියනු ඇසේ. එය වැරදි ය. එහි ඇත්තේ 'ට්ඨ' යන අකුරු දෙකයි. පාලි භාෂාවේ 'ෂ' කාරයක් නැත. තවත් තැනක පුරිසධම්මසාරථී යනුවෙන් වැරදි යෙදුමක් භාවිත වනු පෙනේ. එය 'ධම්ම' නොව 'දම්ම' විය යුතුය.

"අම්හ (අප)","තුම්හ (තොප)" ශබ්ද පිළිබඳ නිවැරදි අවබෝධයක් නොමැති නිසා සෙත් පිරිත් සජ්ඣායනාදියේදී ඇතැමෙක් වැරදි ව්‍යයහාර යොදති. තෙ-මෙ, මය්හං-තුය්හං, මං-ත්වං යනාදී වචන සෙත් පිරිත් භාවිතයේදී නිසි පරිදි යෙදිය යුතු අතර ඇතැම් තැනක එයට ගැලපෙන ලෙස ක්‍රියාපද ද වෙනස් විය යුතුය. උදාහරණයක් ලෙස **'සබ්බීතියෝ විවජ්ජන්තු...'** යන ආශිර්වාද ගාථාව අනුන් අරභයා කියන කල්හි "**මා <u>තෙ</u> භවත්වන්තරායෝ සුඛී දීඝායුකො <u>භව</u>**" යනුවෙන් අවසන් වන අතර තමන් අරභයා කියන කල්හි එය **"මා <u>මෙ</u> භවත්වන්තරායෝ සුඛී දීඝායුකො <u>භවෙ</u>"** වෙනස් විය යුතුය.

මෙවැනි යෙදුම් පිළිබඳ නිවැරදි අවබෝධය නොමැති නිසා **'නක්ඛත්තයක්ඛභූතානං...'** යන ආශිර්වාද ගාථාව අද සාවද්‍ය ලෙස වැහැරෙනු පෙනේ. **'හන්තු තෙසං උපද්දවේ'** යන නිවැරදි යෙදුම ඇතැම් තැනක **'හන්තු මය්හං උපද්දවේ'** හෝ **'හන්ත්වා තෙසං උපද්දවේ'** යනාදී වශයෙන් සදොස් ව යෙදෙනු පෙනේ. මෙම ගාථාවේ පදගතාර්ථ පිළිවෙළ පිළිබඳ නිවැරදි අවබෝධයක් නොමැති බැවින් එසේ සදොස් ව වැහැරේ. **'දෙවො වස්සතු කාලෙන...'** යන ආශිර්වාද ගාථාවේ දෙවැනි පාදය **'සස්ස සම්පත්ති <u>හෝතු</u> ච'** යනුවෙන් හා **'සස්ස සම්පත්ති <u>හේතු</u> ච'** යනුවෙන් දෙයාකාරයකින් උසුරුවනු ඇසේ. මින් වඩා නිවැරදි භාවිතය කුමක්ද යන්න විමසිය යුතුය. වඩා සුදුසු වනුයේ **'සස්ස සම්පත්ති <u>හෝතු</u> ච'** යන්න බව පැහැදිලි ය. මෙම ගාථා පාඨය සරල වාක්‍යයකි. එහි සරල අර්ථයක් ඇත. **'සස්ස සම්පත්ති <u>හේතු</u> ච'** යනුවෙන් යෙදුවහොත් අර්ථය ගැනීමට වෙනත් පාදයක ක්‍රියාපදයක් ඈඳාගත යුතුවේ. මෙම ගාථාව බෝධිචර්යාවතාරයේ එන සකු

සිලෝවක '**ශස්‍ය සම්පත්ති භවතු ච...**' යන පාදයේ පාලි පරිවර්තනයක් ලෙස ඇතැම් තැනක පෙන්වා දී ඇත. ඒ අනුව ද '**සස්ස සම්පත්ති හෝතු ච**' යන්න වඩා යෝග්‍ය බව පැහැදිලි ය.

වන්දනා හා පූජා චාරිත්‍රවලදී භාවිතා කෙරෙන නිශ්චිත පොදු ගාථාමාලාවක් නැති බව හා විවිධ ගාථා භාවිත වීම අද වන්දනා කටයුතුවලදී බෞද්ධයා මුහුණ දෙන තවත් ගැටළුවකි. ගාථා පොත් වන්දනා අත්පොත් සුලභ ව එළිදැක්වුණ ද බොහොවිට ඒවායේ දක්නට ලැබෙනුයේ එකිනෙකට වෙනස් වූ ගාථා ය. දහම්පාසල් හා පාසල් පෙළපොත්වල පවා මේ වෙනස දැකගත හැකි ය. පාලිභාෂාව පිළිබඳ උගත්තෝ මෙන් ම නූගත්තෝ ද විවිධ ගාථාදිය සම්පාදනය කර සමාජගත කිරීමට උත්සාහ ගන්නා අයුරු අද පෙනේ. මේ ගැටළුව අවබෝධ කරගත් 2600 සම්බුද්ධත්ව ජයන්ති මෙහෙයුම් කමිටුව පාලි භාෂාව පිළිබඳ ප්‍රාමාණික උගතුන්ගෙන් යුත් විදග්ධ කමිටුවක් මගින් වන්දනා කටයුතුවලදී භාවිත කෙරෙන ගාථා ඇතුළත් පොදු අත්පොතක් මුද්‍රණය කරවීමට ගත් ප්‍රයත්නය ප්‍රශංසනීය ය.

භික්ෂූන් වහන්සේ නමක් කියන ගාථාදිය අසා නැවත කීමට බොහෝ ගිහි බෞද්ධයෝ හුරු වී සිටිති. එහි දී අනුගාමිකයා තමන්ට ඇසුණු ආකාරයෙන් ධාරණය කරගැනීමටත් ව්‍යවහාරයටත් පෙළඹේ. ධාරණය කරගැනීමට අපහසු වචන සඳහා වෙනත් ආදේශක වචන භාවිතා කරනු ද අසන්නට ලැබේ. මේ නිසා බොහොමක් සාවද්‍ය ව්‍යවහාරයන් අද වන්දනා හා පූජා චාරිත්‍ර කටයුතුවලට එකතු වී ඇත.

මේ සඳහා හොඳ ම උදාහරණය දෙවියන්ට පින් අනුමෝදන් කිරීම සඳහා භාවිතා කරන "**එත්තාවතා ච අම්හේහි...**" යන ගාථාවයි. බොහෝවිට මෙම ගාථාව ඇසෙනුයේ " **එත්තාවතා ච අම්මේහි සම්පදං පුඤ්ඤසම්පදං...**" යනුවෙනි. නමුත් එහි අර්ථවත් නිවැරදි භාවිතය වනුයේ "**එත්තාවතා ච අම්හේහි සම්භතං පුඤ්ඤසම්පදං ...**" යන්නයි. 'සම්භතං' යනු රැස්කළ, එකතුකරගත් යන අදහස ඇති අතීත කෘදන්ත පදයකි. පුඤ්ඤසම්පදං යනු පුණ්‍ය සම්පත්තිය යන අදහස යි.

මෙලෙස නිතර වැරදි අයුරින් උසුරුවනු ඇසෙන ගාථා හා පාඨ කිහිපයක නිවැරදි යෙදුම් අර්ථ සහිත ව මෙසේ දැක්විය හැකිය.

**ඒතං කුසුමසන්තතිං** (මේ මල් පොකුර)

**ඉච්ඡිතං පත්ථිතං තුය්හං** (ඔබේ කැමති වූ සහ ප්‍රාර්ථනා කළ දෑ)

**ලභාමි මොක්ඛං** (මෝක්ෂය ලබමි)

**ඛන්තිමෙත්තබලෙන ච** (ක්ෂාන්තියේ සහ මෛත්‍රියේ බලයෙන්)

මෙම යෙදුම්වල සාවද්‍ය නිරවද්‍යතාව සරල ව ම තේරුම් ගත හැකිය. ලිපිය ද දිගු වන බැවින් විස්තර විභාග නොදක්වමු. '**තාම්බූලදානං, තාම්බූලං පතිගණ්හාතු**' යනාදි වශයෙන් භාවිත වනු ඇසේ. එය තාම්බූල නොව තම්බූල විය යුතුය. පෙළ ග්‍රන්ථවල දක්නට නොලැබුන ද මෙම පදය අටුවා ආදී පසුකාලීන ග්‍රන්ථවල '**තම්බූලපණ්ණං, තම්බූලපසිබ්බකං**' යනාදී වශයෙන් භාවිත වී ඇත. '**තම්බූල**' යන වචනය '**තාම්බූල**' යනුවෙන් යොදා ඇත්තේ ගාථාවල මාත්‍රා ආරක්ෂා කිරීමට විය යුතුය.

මියගිය ඥාතීන්ට පින් අනුමෝදන් කිරීම සඳහා '**ඉදං මෙ ඤාතීනං...**' යන පාළි පාඨය භාවිත වේ. එය '**ඉදං වො ඤාතීනං...**' යනුවෙන් ද ව්‍යවහාර වේ. මෙය ඛුද්දකපාඨ ග්‍රන්ථයේ එන තිරොකුඩ්ඩ සූත්‍රයේ මෙන් ම පේතවත්ථු පාලියේ එන තිරොකුඩ්ඩ පේතවත්ථුවේ සඳහන් පහත දක්වා ඇති ගාථාවෙන් උපුටා ගත්තක් සේ පෙනේ.

**එවං දදන්ති ඤාතීනං යෙ හොන්ති අනුකම්පකා**

**සුචිං පණීතං කාලෙන කප්පියං පාණ භෝජනං**

**ඉදං වො ඤාතීනං හොතු සුඛිතා හොන්තු ඤාතයෝ**

ඇතැම් භික්ෂූන් වහන්සේලා විසින් ගාථාවේ ඇති පරිදි '**ඉදං වො ඤාතීනං හොතු සුඛිතා හොන්තු ඤාතයෝ** ' යනුවෙන් පැවසේ. එහි අදහස වනුයේ 'මෙය තොපගේ ඤාතීන් පිණිස වේවා, ඤාතීහු සුවපත් වෙත්වා.' යනුයි. භික්ෂූන් වහන්සේ අනුගාමිකයන්ට එසේ වදාරති. භික්ෂූන් වහන්සේ මෙසේ ප්‍රකාශ කළ පසු

අනුගාමික පිරිස ද එය ම පුනරුච්චාරණය කිරීමෙන් අභිමතාර්ථය සඵල නොවේ. අරමුණු තම ඥාතීන් සිහිපත් කිරීම නම් 'මෙය මාගේ ඥාතීන් පිණිස වේවා, ඥාතීහු සුවපත් වෙත්වා.' යන අදහසින් '**ඉදං මෙ ඤාතීනං හොතු සුඛිතා හොන්තු ඤාතයෝ** ' යනුවෙන් භාවිත කිරීම වඩා අර්ථාන්විත ය. තෙරුවන් ක්ෂමා කිරීම වෙනුවෙන් භාවිත වන '**කායෙන වාචා චිත්තේන**' යන ගාථාවේ '**අච්චයං**' යනුවෙන් වචනයක් වැහැරේ. එහි අදහස වැරැද්ද යන්නයි. වැරැද්දක් යනු බොහෝ විට පවක් ම නොවේ. එබැවින් මෙම ගාථාවෙන් පව් සමා කිරීමක් සිදු කළ නොහැකි බව බෞද්ධයන් සිහි තබා ගතයුතු කරුණකි.

වන්දනා ගාථාවලදී භාවිත නොවන මෙවැනි වෙනත් සාවද්‍ය ව්‍යවහාරයන් ද අද දක්නට හැකිය. '**එතං බුද්ධානසාසනං**' යන නිවැරදි යෙදුම වෙනුවට 'එතං බුද්ධානුසාසනං' යනුවෙනුත් '**ආරොග්‍යපරමා ලාභා**' යන නිවරුදි යෙදුම වෙනුවට 'ආරොග්‍යා පරමා ලාභා' යනුවෙනුත් භාවිත කිරීම නිදර්ශන ලෙස දැක්විය හැකිය. විශේෂයෙන් අවමගුල් අවස්ථාවල ප්‍රදර්ශනය කෙරෙන බැනර් ආදියේ ද මෙවැනි වැරදි ව්‍යවහාරන් සුලභ ව දැකගත හැකිය. '**රූපං ජීරති මච්චානං නාමගොත්තං න ජීරති**' (සංයුත්ත නිකාය - දෙවතා සංයුත්ත - න ජීරති සූත්‍රය) යන පාලි යෙදුම විවිධ අයුරින් වෙනස් කොට දැක්වීම මේ සඳහා හොඳ ම උදාහරණය යි.

මුල් බුදුසමය තුළ වැඩි වශයෙන් දක්නට නොලැබුණු වර්තමානයේ පෘථුල ලෙස ව්‍යාප්ත ව පවතින මෙම පූජා හා වන්දනා චාරිත්‍ර විධි පිළිබඳ ව විවිධ මත දක්නට හැකිය. විශේෂයෙන් පූජා හා වන්දනා යන පද දෙක අද යෙදෙන අර්ථයෙන් මුල් පිටක ග්‍රන්ථවල යෙදුනු අවස්ථා දුලභ ය. පූජා යන්න විස්තර කරන පාලි ඉංග්‍රීසි ශබ්දකෝෂයට අනුව එහි අර්ථය ගරු කිරීම, ආචාර කිරීම, ගෞරවය පෙන්වන හැසිරීම වැනි අර්ථ මිස පින් හෝ වෙනත් ප්‍රතිඵලයක් අපේක්ෂාවෙන් යම් වස්තුවක් පූජාකිරීම වැනි අර්ථයක් ගැබ් නොවේ. වන්දනා යන්නෙන් ගරු කිරීම, භක්තිය ප්‍රකාශ කිරීම ආදී අර්ථ මිස බුදුන් වැඳීම, බෝධිය වැඳීම ආදී පසු කාලීන ව වර්ධනය වූ පූජා විධිමය අර්ථයක් අදහස් නොකරන ලදී. මීට අමතර ව පූජා පිළිබඳ පැරණි ප්‍රවෘත්තියත් ලෙස සටහන් වී ඇති මජ්ඣිම නිකායේ අරියපරියේසන සූත්‍රයේ එක් ප්‍රකාශයකින් පූජා යන්න ගෞරවාර්ථයෙන් යෙදී ඇත. එහි දී බෝසතුන්ට ආලාරකාලාම තවුසා තම ගෞරවය දැක්වූ බව පෙන්වීම සඳහා 'උළාරාය ච මං පූජාය පූජෙසි' (මහත් වූ පූජාවෙන් ම පිදුවේය.) යනුවෙන් දක්වා ඇත. මෙහි අටුවාව දක්වනුයේ ස්ත්‍රීන් හා පුරුෂයන් ගෙනෙන ලද මල් ආදියෙන් බෝසතුන් පිදූ බව යි. බිම්බිසාර රජු විසින් වේළුවනාරාමය පූජාකිරීම සඳහන් වන මහාවග්ග පාලියේ මහාඛන්ධකයේ එම පූජාව සඳහා 'පූජා' යන වචනය සඳහන් ව නැත. 'මම වෙළුවනය බුදුපාමොක් බික්සඟනට දෙන්නෙම් නම් යෙහෙකි, මම වෙළුවන නම් උයන බුදුපාමොක් බික් සඟනට දෙමියි බුදුරදුන් ඉදිරියේ පැන් වත්කළ බව සඳහන් ව ඇත. (යන්නූනාහං වෙළුවනං උය්‍යානං බුද්ධප්පමුඛස්ස භික්ඛුසංඝස්ස දදෙය්‍යන්'ති, අථ ඛො රාජා මාගධො සෙනියෝ බිම්බිසාරො සොවණ්ණමයං භිංකාරං ගහෙත්වා භගවතෝ ඔණොජෙසි, එතාහං භන්තේ වෙළුවනං උය්‍යානං බුද්ධප්පමුඛස්ස භික්ඛුසංඝස්ස දම්මීති' - මහාවග්ගපාලි-මහාඛන්ධක) මහාපරිනිබ්බාන සූත්‍රයට අනුව පෙනී යන්නේ මල් සුවඳ වර්ගාදියෙන් යමෙක් තමන් වහන්සේ පුදන්නේ නම් එය නිවැරදි පූජාවක් නොවන බව යි. ධර්මානුධර්මප්‍රතිපත්තිය පුරමින් තමන්වහන්සේගේ බුදුවදනට අනුගත වූ පුද්ගලයා සැබවින් ම තමා පුදන්නෙකු බව එහි දක්වා ඇත. එහෙත් බුදුන් වහන්සේ ජීවමාන අවධියේ පවා විවිධ පිරිස් විවිධ දේ රැගෙන බුදුරදුන් පිදීම සඳහා ආ බව උදාන පාලියෙහි හා ජාතක අටුවාවේ මෙන් ම ආනන්ද බෝධි රෝපණය වැනි අවස්ථා තුළින් තහවුරු වේ. මහා පරිනිබ්බාන සූත්‍රයේ සඳහන් අම්බපාලි බුදුරදුන් හමුවට පැමිණි අවස්ථාව, මජ්ඣිම නිකායේ කන්දරක සූත්‍රය, සේඛ සූත්‍රය හා සංයුත්ත නිකායේ කෝසල සංයුත්තාදී බොහෝ තැන්වල බුදුන් දැකීමට පැමිණි පිරිස් මල් ආදිය රැගෙන ආ බවත් සඳහන් නොවේ. එහෙත් මහාපරිනිබ්බාන සූත්‍රයේ සඳහන් අයුරින් බුදුරදුන්ගේ ශාරීරික ධාතූන් තැන්පත් කළ චෛත්‍යයට මල්, සුවඳ වර්ග, සුවඳ කුඩු පුදන්නේ නම් එය බොහෝ හිත සුව පිණිස පවතින බවයි,

පූජා හා වන්දනාදියෙන් නිවන් දැකිය හැකිදැයි කෙනෙකුට සිතිය හැකිය. මල් පහන් ආදිය ප්‍රතිමා, බෝරුක් ඉදිරියේ පූජා කිරීම ඵල රහිත යැයි ද තර්ක කළ හැකිය. කුසල් වැඩූ ප්‍රඥාවන්තයාට නම් මේ කිසිදෙයකින් ඵල නැත. නමුත් ලොව පණ්ඩිතයෝ දුලභ ය හ. බහුතරය වනාහි දන්ධයෝ ය. (දන්ධා ආචරිය බහු, පණ්ඩිතා ච නාම කතිපයා එව හොන්ති - ධම්මපදට්ඨකථා අග්ගසාවකවත්ථු) නමුත් නිර්වානගාමී ප්‍රතිපදාවේ පියවරෙන් පියවර ඉදිරියට යන්නාට මේ සෑම දෙයක් ම අත්‍යවශ්‍ය ය. ගිහි ජනතාව විසින් මෙබඳු වන්දනා හා පූජා පැවැත්වීමෙන් තථාගතයන් වහන්සේ කෙරෙහි සිතා පහදවා ගැනීමෙන් ස්වර්ග සම්පත්තිය ලැබීමට බලාපොරොත්තු වේ. මේ බව අනේකවණ්ණ විමානවත්ථුවේ "පූජෙථ තං පූජනීයස්ස ධාතුං - එවං කිර සග්ගමිතෝ ගමිස්සථ" 'පූජනීය වූ ධාතූන් වහන්සේලාට පූජා කරන්න, මෙසේ කරන්නාවූ අය ස්වර්ගයට යන්නේය' යන්නෙන් පැහැදිලි වේ. බුදුරජාණන්වහන්සේ වැනි උතුමන් වෙනුවෙන් කරනු ලබන අර්ථවත් පූජාවක ප්‍රතිඵල අත්වන බව ද එමගින් පැහැදිලි ය. මහා මහාපරිනිබ්බාන සූත්‍රයේ ථූපාරාහ පුද්ගලයින් වන්දනයට ලක්කළ යුතු පිරිසක් ලෙස දක්වා ඇති අතර එකී ථූපාරාහ පුදගලයන්ගේ ධාතු තැන්පත් කොට චෛත්‍ය නිර්මාණය කොට පුදා පිළිවෙත් කළයුත්තේ ශ්‍රද්ධාව හා ප්‍රඥාව මුල් කොට ගෙන ය. පූජා සිදු කිරීමට යැයි ආහාරපාන වැනි දෑ විනාශ කිරීම අපරාධයකි. බුදු දහම ප්‍රඥාවන්තයා උදෙසා ය. දුප්‍රාඥයා ඉන් වැඩ සිදු කර නොගනියි. (පඤ්ඤාවතො අයං ධම්මො නායං ධම්මො දුප්පඤ්ඤස්ස-දසුත්තර සූත්‍රය, දීඝ නිකාය) එබැවින් ප්‍රඥාවන්ත ව කටයුතු කිරීම සියලු තැනදී ම අතිශය වැදගත් වේ. පූජා චාරිත්‍ර කටයුතුවල ප්‍රාථමික අවස්ථාවන්හිදී ජනිත වන අමූලිකා ශ්‍රද්ධාව ප්‍රඥාව මත පදනම් කරගනිමින් ආකාරවතී ශ්‍රද්ධාව බවට පත් කරගැනීම තුළින් බෞද්ධ පුරුෂාර්ථ සාධනය කරගත හැකි බව ද මෙහිදී සඳහන් කළ හැකිය.

- ආශ්‍රිත ග්‍රන්ථ

**පුණෝ්‍යාපදෙශය**, චන්දවිමල හිමි රේරුකානේ, ශ්‍රී චන්දවිමල ධර්ම පුස්තක සංරක්ෂණ මණ්ඩලය,1996

**සත්‍යෝදය**, රාහුල හිමි වල්පොළ, ගොඩගේ කොළඹ, 2008

**පාලි සිංහල පිරිත් පොත**, ප්‍රඥාසාර හිමි කිරිවත්තුඩුවේ, ගොඩගේ කොළඹ, 2002

**පාලි සිංහල අකාරාදිය බුද්ධදත්ත** හිමි පොල්වත්තේ, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය දෙහිවල, 1998

දහම්පාසල් පෙළ පොත්, පාසල් බුද්ධධර්මය පෙළපොත් හා වන්දනා ගාථා පොත් ආදිය